

# දිවිලත් ගව පොව්වා

ලාල් ඇන්තනීස්

1990 මාර්තුවෙහි පීඩා සහිත ග්‍රීෂ්මයක් පවතිද්දී අපි දිවා භෝජනය සඳහා ප්‍රමාද වී වන සත්ව ආරක්ෂක සමාජයේ නවාතැනට පැමිණියෙමු. එහෙත් ඈතට අතු විහිදුණු සියඹලා ගස යට පුදුම සිසිලක් පැවතුණා. අපි ඒ යට ඉඳගෙන ආහාර ගෙන මඳ විවේකයෙකින් පසු බුන්දලට අපගේ මෝටර් රිය පැදෙව්වෙමු. යාල පෙදෙස තරමටම එහි වියළි බව පැවැතිණ. උෂ්ණය එසේ වුවත් හැන්දෑව මනහර විය. බැස යන හිරු ගේ රන්වන් රැස් දහරින් එම හැන්දෑවේ බුන්දල නැවී ගියේය. නානා වර්ණයන් ගෙන් යුත් කොක්කු වෙනස් පැහැ ගනිමින් වැව ඉවුරේ පෙළ සැදී උන්හ. ඒ සැන්දෑවේ අපි අලි දෙදෙනකු දුටිමු. දෙදෙනාම පිරිමි සත්තුය. ඉඩෝරය පැවැතුණත් ආහාර හිඟයක් තිබුණු බවක් ඔවුන් ගේ ඇඟ පතින් නොපෙනිණ. එකෙක් මඳ කිපුණෙකි.

අප පෙරළා නවාතැනට පැමිණෙන විට දිළුණ එම රන්වන් සැන්දෑව දුඹුරු කහ පැහැයකට හැරී අඳුරට පත් විය. ඒ අන්ධකාර රැයේ හඳ එළියක් නොවීය. එහෙත් අහසට අයත් රුවන් ආකරය බැබළෙන්නට විය. එහි රශ්මිය අප අවට පිහිටි යටිගොන්න දිළිසෙන රිදී සළුවක් සේ වසා සිටියේය.. එතැන අපි වටේට ඉඳගෙන යාල වනෝද්‍යානයේ අප ගතකරන ඉදිරි දින වලදී දී බලාපොරොත්තු විය හැකි තත්ත්වය සාකච්ඡා කෙළෙමු. ළඟදී යාලට පැමිනුණු මගේ මිතුරන් කීප දෙනෙකුම මට කියා තිබුණේ එම අවදියේ යාල වන සතුන් ගෙන් ගහණව පැවැති බවයි. එහෙත් මට හැඟී ගියේ ඊට වෙනස් තත්ත්වයකි. දහස් ගණන් තරු වලින් දිළිසෙන අහසත් දිවා කාලයෙහි පවතින අධික උෂ්ණයත් රැට හමන ශීත මඳ සුළඟත් නිසා මට මේ සිතිවිල්ල පහළ විය. මම කැටුව පැමිණි අයට (මගේ බිරිය, මගේ මිත්‍ර ලකි, මගේ බිරිය ගේ ඥාති සහෝදර ලියොනි ආදීනට) මේ ගමනේ දී වෙනදා මෙන් ප්‍රමෝදමත් යමක් බලාපොරොත්තු නොවන මෙන් පැවසුවෙමි. එහෙත් මේ අදහස් පවසන විට මා කිසි සේත් හීන්වැවෙන් අපට ලැබෙන්නට යන්නේ මොනවාද යන්න සිනෙකින්වත් නොසිතුවා විය හැකිය.

වනෝද්‍යානය තුළ තත්ත්වය පිටතට වඩා හොඳින් පැවැතිණ. එහෙත් වර්ෂා හිඟය කැලෑ පෙදෙස් පෙන්නුම් කළේය. දිය කඩිති සහ වලවල්වල සෑහෙන පමණට ජලය තිබිණ. අලි රංචු වනෝද්‍යානයේ මැනෙවින් පැතිරී සිටියහ. ඒ හවස් වරුවේ යාලෙහි වලසුන් දක්නට නොලැබිණ. කොටින් සිටි බවට ලකුණු නොතිබිණ.

හීන්වැවේ ගත කළ පළමු උදෑසන වියළි සිසිල දැනවීය නිහඬ හොල්මන් මෙන් නානා හැඩහුරුකම් ගනිමින් හිරු රැසට දිය වී යන, වැවේ ජලය මතුපිට ලිස්සා යන උදෑසන මීදුම දිහා බලමින් උණු කෝපි කෝප්පයක රස විඳිමින් මම ඉඳගෙන සිටියෙමි. මේ මනහර උදෑසනට නව රසයක් එක් කරමින් වැවට අරක්ගත් රාජාලියා ගේ හඬ නැගෙන්නට විය. වැවේ අනෙක් ඉවුරෙන් උගේ සහකාරිය ගේ පිළිතුර ලැබිණ. මගේ මිතුරා, ලකි වැව් කණ්ඩියේ හිටගෙන මේ කුරුල්ලන් ඉන්නා තැන සොයනු මම දුටිමි.

නවාතැන වෙත ඔහු වේගයෙන් ගමන් කරන්නට විය. මා ආලින්දයේ සිටිනු දුටු ඔහු මට අත වන්නට විය.

මම ලකී හා එක්වීමි. වැව් කණ්ඩියේ සිට හේ මට මලිත්තන් ගසක් දැක්වීය. එය අප සිටි තැන සිට යාර 50 පමණ වම් පසින් පිහිටියේ ය. මම ඒ දිහා ඕනෑකමින් බැලුයෙමි. බිම සිට අඩි 8 පමණ උසින් ගසෙක දෙබලක් අස්සේ රැදී හිර වී සිටින මීහරක් පැටියකු මොහොතකින් දුටිමි. ඊට කලින් දා රෑ සිද්ධි මගේ මතකයට නැඟුණේ එවිටය. මට මෙතෙක් ඒවා අමතක වී තිබිණ. එදා හිමිදිරියේ 4.15 ට පමණ මම දැඩි නින්දේ වීමි. මගේ බිරිය ප්‍රියානි හදිසියේ ම මා තදින් සොලවා අවදි කළේය. ඇය වචනයක්වත් කතා කරන්නට පෙර කොටියකු ගොරවනු ඇසිණ. නිහැඬි රැයේ මට දැනුනේ ඌ නවාතැනින් පිටත සිටින ලෙසටය. මා ඇඳෙන් නැඟිට බලන විට ලකී අවදි වී බාග බිත්තියට හාන්සි වී අඳුර දිහා බලා සිටිනු දුටුවෙමි. එය දැඩි අඳුරු රැයකි. විදුලි පන්දම අල්ලන්න දැයි ලකී ඇසීය. මා ඔහුට එය එපා කළා පමණයි. මහ කලබලයක් ඇති විය. වැවේ දවස ගත කළ මීහරක් රැන මරහඬ දෙන්නට විය. කැලෑව පෙරළෙන හඬ, වඩ දිය වීසි වන හඬ, දුවන මීමුන්ගේ කුර හඬ එක් වෙමින් රැව් දෙන්නට විය. මේ හඬට කොටියා ගේ ගෙරවිල්ලත් රාවයත් මුසු විය. මෙය මිනිත්තුවක් පමණ පැවැතිණ. මොහොතකින් නැවතිණ. සියල්ල නිහඬ විය. ඉන් පසු පැය බාගයක් පමණ අපට ඇසුනේ කරදරයට පත් වූ මීහරක් පැටවකු ගේ හඬය. අප වැව පැත්තට කීප විටක්ම විදුලි පන්දම ඇල්ලූ නමුත් කිසිවක් නොපෙනිණ. ක්‍රමයෙන් වහු පැටවා ගේ හඬ නතර විය. අපි කැඩුණු නින්දට නැවත වැටුනෙමු.

දැන් මම වැව් කණ්ඩිය මත සිටගෙන වූයේ කුමක් දැයි බලන්නට උත්සාහ කෙළෙමි. කොටියා වහු පැටවා පසුපස සැඟෙන වේලාවක් ගිය බවට සැකයක් නැත. ඌ සිය රැළෙන් මඳ වේලාවක් හෝ වෙන්වී සිටි නිසා ඌ කොටියාට අසු විය. ඒ විටය මීහරක් රැළ ප්‍රති ප්‍රහාරය කොටියාට එල්ල කරන්නට වූයේ. කොටියා තමාගේ ගොදුර ලෙහෙසි යෙන් අත නොහැර ගසට නැඟ, දෙබළ අතරේ එය රඳවා පැන ගියේය.

මම අපේ කට්ටිය වැව් කණ්ඩියට කැඳවා ඔවුනට වහු පැටයා පෙන්වා, අපේ ඊළඟ පියවර විසඳා ගතිමි. දවල් කාලයේ කොටියා නැවත ගස ළඟට නොඑනු ඇත. හේතුව මීහරක් රැළත්, නවාතැනත් ගසට නුදුරින් තිබීමයි. එම නිසා අපේ හැන්දෑවේ ගමන කල් දමා නවාතැනේ සිට මුර කිරීමට අදහස් කළෙමු. කොටියා සිය ගොදුර බුක්ති විඳීමට හැන්දෑ වන විට එනු ඇතැයි සිතීමු.

අප මෙලෙස සිතා පියවර කීපයක් ඉදිරියට තබනවාත් සමගම ගහ දිහාවෙන් හඬක් ඇසිණ. ඒ දෙස බලන විට වස්සා සිය පසු දෙපා ගසනු පෙනිණ. "දෙවියනේ අරූ තාමත් පණ පිටින්" යැයි මට කියවිණ. අපි කවුරුත් නැවත වැව් කණ්ඩියට දිව්වෙමු. මම වන සතුන් පෙන්වන ධර්මරත්නට, නවාතැන බාරකාර පියසේනට, ඔහු ගේ උදව්කාරයාට සහ තවත් කෙනෙකුට කතා කළෙමි. අප කුමක් කළ යුතුදැයි සතුන් පෙන්වන්නා ගෙන් ඇසීමි. ඔහු පිළිතුරු දෙන්නට පෙර නියම ගැහැනු හැඟීම් පළ කරමින් මගේ බිරිය, "අප කොහොම හරි ඌ බේරන්න ඕනෑ" යි කීවාය.

එහෙත් එය ලෙහෙසි නොවේ. ධර්මරත්න නිසි උත්තරය දෙමින් "ඒ කොටියා ගේ ගොදුර" යැයි කීය. මම එකඟ වීමි. එහෙත් ඒ එක්කම මා ධර්මරත්න ගෙන් ඇහුවා, "අර කුඩා වහු පැටියා ගහ උඩ හිර වී මුළු දවස තිස්සේ, මාරයා එනතුරු බලා ඉන්නා විට, අප මේ නවාතැනේ ඉඳගෙන දෙවේලටම කාබී, හවසට නිදාගෙන සැප සේ කාලය ගත කරනවාද? මා හිතන්නේ නැහැ අපට එය වටිනවාය කියා" "තරාදියේ වඩා බර කුමක්ද? ඉමහත් මහන්සියෙන් කෙනකු සොයාගත් ආහාරය පැහැර ගැනීම ද? එසේ කරමින් ජීවිතයක් බේරා ගැනීම ද?" ධර්මරත්න පිළිතුරක් නුදුන්නේය. මේ නඩය ගැන සලකන විට එහි නායකයා මායි. එහෙයින් අවසන් තීරණය මගේය. මෙතැන දී මට මගේ පියා ගේ වදන් මතක් විය. බොහෝ කලකට ඉහත, මා පාසල් සිසුවකුව සිටින අවදියේ ඔහු මට කීවේ, "ලාල් මම වෛද්‍යවරයෙක්. මම ජීවිත බේරාගන්නටත් ජීවිත කාලය දික්කරන්නටත් දිවුරුම් දී සිටිමි. ජීවත් වන සත්වයාට තිබෙන වටිනා දයාදය ජීවිතය බව අපේ ආගම අපට උගන්නවා තිබෙනවා. අපට එය දෙන්න බලයක් නැත. එය ගන්නට අයිතියකුත් නැත. තත්ත්වය කුමක් වුවත්, ඔබට ජීවිතයක් රැකීමට හෝ ජීවිත කාලය දික් කිරීමට හෝ අවස්ථාවක් ලැබුණොත් හැකි නම් ඔබ එය කළ යුතුයි" මේ වදන් මගේ උදව්වට පැමිණියේය. මම තීරණය ගත්තෙමි.

මම ධර්මරත්නට කීවෙමි. "අපි වහු පැටියා සෝදිසි කර බලමු. උගේ තුවාල දරුණු නැත්නම් අපි ඌ නිදහස් කරමු. කොටියාට ඌ එක වරට මරාගන්නට බැරිවුණා නම්, ඌ බේරී යෑමට සුදුසුය. අපි ඒ කුඩා වහු පැටවාට ඒ වරය දෙමු." සියලුදෙනා එකඟ වූහ.

මම සැම විටම ජාතික වනෝද්‍යානවල නීතිය රකින්නට බැඳී සිටිමි. එලෙසම මුළු පරිසරයම රැකීමට බැඳී සිටිමි. රූපවාහිනියට පටිගත කරන විට

වරකට මාසයක් පමණ උද්‍යානයේ ගත කළෙමි. මට ඕනෑම විටෙක රථයෙන් බසින්නට අවසරය තිබිණ. එහෙත් එසේ නොබැසම බැරිවිටෙක හැරෙන්නට මම එය නොකළෙමි. එහෙත් මෙය මූලික නීතිය කඩ කිරීමට දරන පැහැදිලි උත්සාහයකි. තහනම් පෙදෙසට යාර 50 ගමන් කිරීමකි. ස්වභාවධර්මයේ මූලික න්‍යායයනට ඇඟිලි ගැසීමකි. දන් මම කැලෑ වලින් බොහෝ ඈත, මගේ ටයිප්රයිටරය ඉදිරියේ සිටිමින් සිතමි. මෙය අකටයුත්තක් ලෙස පැතිරෙන්නට ඉඩ තිබේ. එදා සුළං හමන ඒ වැව් කණ්ඩිය මත සිටිමින්, කෑගසමින් ජීවත් වීමට දඟලන ඒ වස්සා දකිමින් ඌ බේරා ගන්නට තිබුණු දැඩි ආශාව සියලු තර්ක විතර්ක අභිබවා සිටියේය. මේ සතා මුදා ගැනීමේ දී අපි උවදුරු දෙකකට මුහුණ දුන්නෙමු. ඌ ගේ අම්මා, ඒ මීදෙන යාර 30 පමණ ඈත සිට ගහ දිහා නෙත් නොහෙළා බලා සිටී. බඩගින්නෙන් පෙළෙන අර කොටියා කොහේ හෝ ළඟ පඳුරක සැඟ වී බලා සිටිනු ඇත.

ලකී, ප්‍රියානි සහ ලියොනි වැව් කණ්ඩිය මත නවතා, අනතුරක හෝඩුවාවක් දැනුණොත් අත වනන ලෙස කියා, අපි ටිකින් ටික ගස මුලට ළං වුනෙමු. වස්සා හිරවී සිටියේ අපේ අත් යම්තම් පෙවිය නොහැකි උසක ය. ඌට ළං වීමට අපට එක් අත්තකට නඟින්නට සිදු විය. අපි ඌ හොඳින් පරීක්ෂා කළෙමු. කිසිම තුවාලයක් නොතිබීම පුදුමයට හේතු විය. තවත් ළං වී පරීක්ෂා කළ විට එක් තට්ටමක දත් පාරක් පෙනිණ. ඒ යට ලේ කැටි ගැසීමක් තිබිණ. එය බොහෝ ඉක්මනින් කරන ලද වැඩක් නිසාදෝ වසු පැටවාට දැඩි තුවාල සිදුවී නොතිබිණ. කොටියා උගේ තට්ටමින් ඩැහැ ගෙන , වේගයෙන් ගසට නැඟ දෙබලෙහි රඳවා පැන යන්නට ඇත. අවට පරිසරය දුටු විටත්, වස්සා රඳවා තිබුණු ආකාරයත් සලකන විට මෙය ඉතා පරිස්සමින්, මැනවින් සැලසුම් කර, වස්සා තනිවන තුරු බලාසිට තෝරා ගෙන තුබූ ගසකට ගෙනවුත් රැඳවූ බව පෙනී ගියේය. මඳ වූද ප්‍රමාදයක් වුණි නම්, කොටියාට මී හරක් රැළෙන් හොඳ සැළකිලි ලැබෙන්න ඉඩ තිබිණ. මෙය සිහි වූ විට මගේ සිතට චකිතයක් ඇති විය.

වහු පැටවා ඌගේ උරහිස ළඟට අඩි දෙකක් පමණ උස විය. යටිබඩ ළඟින් දෙබලේ හිරවී සිටියේය. කොටියා හිර කිරීම මැනවින් කර තිබිණ. වහු පැටියා ගේ දඟලීම නිසා තව දුරටත් හිර විය. අප ඌ උස්සන්නට උත්සාහ කළ විට කෑගසන්නටත් කකුල් වලින් පහර දෙන්නටත් විය. දෙවන අවස්ථාවෙහි අපි උගේ පසුපසින් ඔසවන්නට තැත් කළෙමු. මෙවර ඌ ලතෝනි දෙන විට ලකී ද කෑගසන්නට විය. අපි ගසින් බිමට පැන මී දෙන ඉන්නා දිහාව බැලීමු. මීදෙන හිස ඔසවා ගෙන අප දිහාවට ගමන් කරන්නට වූවාය. එය ප්‍රතාපවත් ගමනකි. අලංකාර දර්ශනයකි. ඇය ඇගේ දකුණු කකුලින් බිමට ගසා ගමන ඉක්මන් කළාය. මගේ උගුරකට වේලී ගියේය. දුවන්නැයි ඉබේම කියවිණ. අපි නවාතැන දිහාවට දිවුවෙමු. ඇගේ අඩි ශබ්දය ඇසෙන්නට විය. එය හිටි හැටියේ නතර විය. අපිදු දිවීම නතර කෙළෙමු. හැරී බැලූ විට මී දෙන ගහ යටය. අප දිහා රවා බැලුවාය. හදිසියේ ම ඇට නුවණක් පහළ විය. හිස ගසාදමා, කැරකී ඉක්මනට යාර 20 පමණ ඈතට ගොස් පඳුරකට මුවා වී අප දිහා බලා සිටියාය. අපට කරදරයක් නැති බව ඉබේටම වැටහී ගියේය. අප උදව්වක් කරන්නට යන බව මීදෙනට වැටහිණ.

ගහ ළඟට ආපහු ගිය විට ගහේ අත්තක් නොකපා වසු පැටියා මුදා ගැනීමට නොහැකි බව අපට පිහිණ. මෙය ඉතා පරිස්සමින් කළ යුතු විය පියසේන එය හොඳින් කළේය. එයට ගියේ මිනිත්තු 10 කි. මීදෙන අප දිහා නිසොල්මනේ බලා සිටියාය. පැටවා විටින් විට හඬලන විට පවා කලබල නොවූවාය.

අත්ත කැපූ පසු වසු පැටවා ඔසවා පහළට ගැනීම පහසුය. අපි ඌ දෙකළවරින් ඔසවා බිම තැබීමු. අප උදව්වක් කරන්නට යන බව ඉවෙන් මෙන් දැනගත් ඌ ඕනෑ දෙයක් කිරීමට අපට ඉඩ දුන්නේය.

අප ඌ ඔසවා බිම තැබූ විට පස්සා ගාත් දෙක නැවී කොන්ද බිම ඇනුණේය. හෙමෙන් හෙමෙන් ඌ ඉස්සරහ ගැත් දෙකේ වාරුවෙන් ඉදිරියට ගියේය. පසු ගාත් දෙකට ද සවිය එන බව අපට පෙනිණ. මුල දී ඉතා අමාරුවෙන් ඉදිරියට ඇදුණු ඌ, අඩියෙන් අඩිය හයිය ලබා, හොඳට කෙලින් හිට ගත්තේය. අප ගෙන් ඈත් වී අඩි 15 පමණ ඉදිරියට ගිය පසු ඌට ගාත් හතරින් ම හොඳට හිටගත හැකි විය. ඉන් පසු පුදුමෙන් පුදුමයක් සිදු විය. ඌ මොහොතකින් හැරී, අප දිහාවට ආවේය. හිස ඔසවා අප දිහා බලා සිටියේය.

මම අවුරුදු 30 පමණ කැලෑවේ ඇවිද ඇත්තෙමි. එහෙත් මෙතරම් කම්පා කරවන මොහොතක් ගත නොකෙළෙමි. අවුරුදු ගණනාවක සිදුවීම් සහ අත්දැකීම් වලින් මගේ සිත දැඩි වී තිබුණත්, මේ මොහොතේ මගේ උගුර හිරවන ගතියක් මට දැනිණ. මී දෙන පඳුරෙන් පිට වී අප දිහාවට ගමන් කරනු මගේ දෑසේ කඳුළු අස්සෙන් මට පෙනුණේය. මගේ මිතුරෝ පස්සට වූහ. 'හෙල්ලෙන්න එපා' යැයි මම දත් තදකරගෙන කීවෙමි. ඔවුහු ගල්ගැසුණහ. මී දෙන පැටවා ළඟට ආවාය. උගේ මුණ ලෙවකෑවාය. බෙල්ල ඉඹ්බාය. දෙදෙනා මහැරී ආපසු නොබලා යන්නට ගියහ. මගේ ඇස්වල කඳුළු ඉවත් වී, ඔවුන් ඈතට යමින් කුඩා වනු බලා සිටියෙමි. අප හරි දෙය කළ බව දනිමි.